# *13 වන දවස*

## "ඔබගේ රාජ්‍යය පැමිණේවා"

**"නියමිත මොහොත පරිපූර්ණ වී තිබේ දෙවියන් වහන්සේගේ රාජ්‍යය ආසන්නය"** (ශු. මාක් 1:15).

සමිඳාණන් වහන්සේ පියාණන් වහන්සේගේ අසීමිත ප්‍රේමය අත්දකින සේක. එනම් කොන්දේසි රහිතව සියල්ලන්ට ප්‍රේම කරන්නට පිපාසයක්; ඒ ප්‍රේමය අත්දකින්නට පිපාසයක්; ප්‍රේමයෙන් පිරුණු දේව රාජ්‍යය දැකීමට පිපාසයක්.

**"ඔබ අතුරෙන් බැටළුවන් සියයක් ඇති කවර මනුෂ්‍යයෙක්, උන්ගෙන් එකෙකු නැති වුවහොත්, අනූ නව දෙනා පාළුකරයෙහි හැරදමා, නැති වූ එකා පසු පස්සේ ගොස් ඌ සම්බවන තුරු සොයන්නේ නැද්ද? ඒ බැටළුවා සම්බ වූ විට ඔහු ප්‍රීති වෙමින්, ඌ කර තබාගෙන ගෙදර අවුත් මිතුරන් ද, අසල්වැසියන් ද කැඳවා, 'මා සමග ප්‍රීති වන්න, මාගේ නැති වූ බැටළුවා සම්බවීය'යි ඔවුන්ට කියයි"** (ශු. ලූක් 15:4-6).

දේව රාජ්‍යය ආසන්න යයි පවසද්දී, නොකියා පවසනුයේ ප්‍රේමයේ දේව රාජ්‍යය අත්දකින්නට නොවේද?

- දුබලකමට ප්‍රේම කිරීම
- දුබලයාව ඔසොවාගෙන යාම, සමාව දීම - ලැබීම
- බලාපොරොත්තු රහිතව ප්‍රේම කිරීම
- මම, මට, මගේ කියන තැනින් හිස්වී කොන්දේසි රහිතව ප්‍රේම කරමින් දේව රාජ්‍යය දැකීමට පිපාසා වීම.

*අබ්බා පියාණෙනි, අප එදිනෙදා මුහුණ දෙන විවිධ සිදුවීම් තුළ කොන්දේසි රහිතව ප්‍රේම කිරීමට අපට බලයක් දුන මැනව.*

**දවස පුරා :-** ✵ ඔවුන් වහන්සේගේ ප්‍රේමයේ පවතිමු.
✵ ශු. ලූක් 15:1-10
✵ පුබුදු ගීතාංජලී ගී අංක 27